# 20 වන දවස

## ඔබවහන්සේගේ කැමැත්ත ඉටුවේවා !
## ස්වර්ගයෙහි මෙන් පොළොවෙහි ද එසේ ම වේවා !

දේව සැලැස්මේ අරමුණ කරා ලෝකය රැගෙන යාමට ක්‍රිස්තුන් වහන්සේ දෙවිඳුන් හා මිනිසා වෙනුවෙන් ආමෙන් කියද්දී මිනිස් දියණියකට ද මිනිස් සංහතිය වෙනුවෙන් එම කැඳවීමට පංගුකාර වීමට කැඳවීමක් ලැබී තිබුණි.

පුරාණ ගිවිසුමෙහි ද, නව ගිවිසුමෙහි ද, ශුද්ධවූ සභාවේ ජීවමාන සම්ප්‍රදාය තුළ ද භාග්‍යවන්ත මෑණියන්ගේ දූත මෙහෙය ක්‍රමානුකූලව අපට වඩා පැහැදිලි වෙයි. ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනය සඳහා ලෝකය ක්‍රමයෙන් සූදානම් කළ ආකාරය ගැළවීමේ ඉතිහාසය තුළ පුරාණ ගිවිසුම අපට විස්තර කරයි. පූර්ණ දේව අනාවරණයේ පසුබිමින් බලන කළ පුරාණ ගිවිසුමේ උත්පත්ති පොතේ සඳහන් ''ස්ත්‍රිය'' කව්දැයි හොඳහැටි පැහැදිලි වෙයි. (උත්පත්ති 3:15) **''කන්‍යාවක් ගැබ් ගෙන පුතෙකු බිහි කරන්නී ය. එතුමන්ට එම්මානුවෙල් යන නම තබන්න''** (යෙසායා 7:14, මීකා 5:2-3) යන පොරොන්දුව ඉටු වීමට දීර්ඝ කාලයක් ගත වී ගිය පසු ඕතුමන් තුළ කාලය සම්පූර්ණ වී (ගැළවීමේ) දේව සැලැස්ම ක්‍රියාත්මක වන්නට විය.

ගැළවුම්කාරයාණන්ගේ මාතාවන් වනු සඳහා භාග්‍යවන්ත මෑණියන්ව දෙවියන් වහන්සේ විසින් නියම කරනු ලැබ සිටිය ද ඔවුන් වහන්සේ මාංශ ගතවීමට පෙර ඕතුමන්ගේ කැමැත්ත විමසීම දයාබර දෙව් පියාණන්ගේ අභිමතය විය. ලොව වෙත මරණය ගෙන එන්නට එක ස්ත්‍රියක් හේතු වූවාක් මෙන් තව ස්ත්‍රියක් ජීවනය එය වෙත ගෙන ඒමට උපකාරී විය යුතුව තිබුණේ ය. තව ද සියලු මැවිල්ල හට නව උදාවක් ගෙන දෙන ජීවනය භාග්‍යවන්ත මෑණියන් සැබවින් ම ලොවට බිහි කළා ය (ලුමෙන් ජෙන්සියුම් - ජාතීන්ගේ ආලෝකය නම් දෙවන වතිකානු ප්‍රකාශනයෙහි අංක 311,312).

**දවස පුරා :-**
- ✵ ''මේ මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි''
- ✵ ශු. ලූක් 1:26-38
- ✵ පුබුදු ගීතාංජලී ගී අංක 132